පළාත් අධිකරණ කොමසාරිස්
21 MAR 2001
ගාල්ල.

මගේ අංකය: ආර්සී 20/93

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 256**

**සියළුම,**
මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

<u>අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ට පිස්කල් කටයුතු සඳහා දීමනාවක් ලබාදීම</u>

අධිකරණවල සේවය කරනු ලබන රෙජිස්ට්‍රාර්වරුන්ට පිස්කල් රාජකාරි කටයුතු කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි අදාල නඩුවල පාර්ශවකරුවන්ගෙන් ගාස්තු අයකර ගැනීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/309ජ201/25 හා 2000.08.17 දිනැති ලිපියෙන් අනුමත කර එවා ඇත. ඒ අනුව එම ගාස්තු ලබා ගැනීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අනුමත කරන ලදී.

**<u>පිස්කල් රාජකාරි කටයුතු කිරීම වෙනුවෙන් ලබාගත යුතු ගාස්තු :</u>**

I. පිස්කල් රාජකාරිය කරන නිලධාරියාට රු.600/-.
II. ඔහුට සහායට යන නිලධාරයෙකුට රු:300/-.
III. කා.කා.ස. හෝ ආරක්ෂාව සපයන පොලිස් නිලධාරයෙකුට රු:300/-
IV. අයකරන්නන්ට ගමන් පහසුකම් සපයන්නේ නම් පමණක් පිස්කල් නිලධාරියාට සැතපුම්කට රු.15/- බැගින් සැතපුම් කුලිය.

02. මෙම ගාස්තු ලබාගැනීමේදී භාණ්ඩාගාර මුදල් අධ්‍යක්ෂ ජනරාලයගේ අංක මුදල් 1029-197-646 හා 1999.09.14 දිනැති ලිපියේ දක්වා ඇති පහත සඳහන් කොන්දේසි අනුව බැව් වැඩිදුරටත් දන්වා සිටිමි.

I. රෙජිස්ට්‍රාරවරුන් සහ වෙනත් නිලධරයන් විසින් පිස්කල කටයුතු සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තු සියල්ලම ප්‍රථමයෙන් රජයේ ආදායමට බැර කළයුතු යි.

II. රෙජිස්ට්‍රාර්වරුන්ට සහ අනෙකුත් නිලධාරීන්ට ගෙවීමට යෝජිත නියමිත ගාස්තු අමාත්‍යාංශ වැය ප්‍රතිපාදන වලින් ලබාගත යුතුය.

03. පිස්කල් රාජකාර කටයුතු කිරීම වෙනුවෙන ඉහත දක්වා ඇති ගාස්තුවලට අමතරව මොනයම්ම හෝ පෞද්ගලික මත මෙවැනි කිසිදු ආකාරයක ගාස්තුවක් ලබා නොගත යුතු අතර, එසේ අමතර ගාස්තුවක් ලබාගැනීම පැහැදිලි වශයෙන්ම අල්ලසක් වන බැවින් ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බැව් වැඩිදුරටත් දන්වා සිටිමි.

03. මෙම චක්‍රලේඛය ඔබ අධිකරණයේ සියළුම නිලධරයන්ගේ දැන ගැනීමට සලස්වන්න.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2000 සැප්තැම්බර් මස 27 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය